සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW**

**2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්**
**(නව නිර්දේශය)**

**09 | S | I, II**

පැ තුනයි

**2018.12.29 /12.30 - 15.40**

**(09) සෞඛ්‍ය විද්‍යාව - I, II**

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සෞඛ්‍ය විද්‍යාව - I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ජීවයේ සම්භවය සිදු වූ ආකාරය පිළිබඳව නාසා ආයතනය ඉදිරිපත් කළ අභිනව මතයට සමාන මතයක් ඉදිරිපත් කළේ,
   (1) චාල්ස් ඩාවින් ය.
   (2) ඇරිස්ටෝටල් ය.
   (3) බුදුරජාණන් වහන්සේ ය.
   (4) ජේසුස් වහන්සේ ය.

2.



ඉහත සටහනේ හිස් කොටුව පිරවීමට වඩාත් සුදුසු වචන වන්නේ,
   (1) 'පූර්ණ පෞරුෂය' යන්න ය.
   (2) 'සෞඛ්‍ය ප්‍රවර්ධනය' යන්න ය.
   (3) 'පූර්ණ සෞඛ්‍යය' යන්න ය.
   (4) 'නිරෝගී බව' යන්න ය.

● තම පිරිවෙන සෞඛ්‍ය ප්‍රවර්ධන පිරිවෙනක් කිරීම සඳහා පිරිවෙනාධිපති ස්වාමීන් වහන්සේ ගෙන ඇති ක්‍රියාමාර්ග කිහිපයක් පහත 'අ' , 'ආ' , 'ඉ' , 'ඊ' සහ 'උ' යන වගන්තිවලින් දැක්වේ. ඒ ඇසුරින් ප්‍රශ්න අංක 3 සිට 5 තෙක් ප්‍රශ්නවල පිළිතුරු සපයන්න.

(අ) පිරිවෙන තුළ පොලිතින් භාවිතය අවම කිරීම
(ආ) පිරිවෙන් පන්තිකාමරවලට හා නේවාසිකාගාරයේ කාමරවලට නිසි පරිදි වාතය ලැබෙන සේ කවුළු තැබීම
(ඉ) සියලු දෙනාට ම පොදු වූ දිනචර්යාවක් භාවිත කිරීම
(ඊ) පිරිවෙන් සිසුන් වෙනුවෙන් සෞඛ්‍ය සායන පැවැත්වීම
(උ) දායක දායිකාවන්ගේ සහභාගිත්වයෙන් පිරිවෙනෙහි මාර්ග එළිපෙහෙළි කිරීම

3. පිරිවෙනාධිපති ස්වාමීන් වහන්සේ විසින් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති ප්‍රතිපත්ති දක්වා ඇති වගන්තිය/වගන්ති වන්නේ,
   (1) 'අ' පමණි.
   (2) 'ඉ' පමණි.
   (3) 'අ' සහ 'ඉ' පමණි.
   (4) 'අ' , 'ආ' සහ 'ඊ' පමණි.



Department of Examinations Sri Lanka

4. සෞඛ්‍ය ප්‍රවර්ධනය උදෙසා ප්‍රජා සහභාගිත්වය ලබා ගෙන ඇති බව දක්වන්නේ,
   (1) 'අ' සහ 'ඊ' වගන්තිවලිනි. (2) 'ඉ' සහ 'උ' වගන්තිවලිනි.
   (3) 'ඉ' වගන්තිය මගිනි. (4) 'උ' වගන්තිය මගිනි.

5. පිරිවෙනාධිපති ස්වාමීන් වහන්සේ විසින් සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගය දක්වා ඇති වගන්තිය,
   (1) 'ආ' ය. (2) 'ඉ' ය. (3) 'ඊ' ය. (4) 'උ' ය.

● වැඩිහිටියකුගේ BMI අගය වයසට එදිරිව සුදුසු ප්‍රස්තාරයක ලකුණු කළ විට, එම ලක්ෂ්‍ය පිහිටන කලාපයේ වර්ණය අනුව පෝෂණ මට්ටම තීරණය වන ආකාරය පහත සටහනෙහි දැක්වේ. ඒ ඇසුරින් ප්‍රශ්න අංක **6** සිට **8** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ණය | BMI දර්ශක පරාස |
|---|---|
| තැඹිලි පාට | 18.5 ට අඩු |
| කොළ පාට | 18.5 - 22.9 |
| ලා දම් පාට | 23.0 - 26.9 |
| තද දම් පාට | 27 ට වැඩි |

6. *A* නමැති පුද්ගලයාගේ උසට සරිලන බරක් ඇත. ඔහු අයත් වන්නේ,
   (1) කොළ පැහැති පරාසයට ය. (2) ලා දම් පැහැති පරාසයට ය.
   (3) තද දම් පැහැති පරාසයට ය. (4) තැඹිලි පැහැති පරාසයට ය.

7. තැඹිලි පැහැති පරාසයට අයත් *B* නමැති පුද්ගලයා,
   (1) ස්ථූලතාවෙන් පෙළේ. (2) කෘෂ බවින් යුක්ත ය.
   (3) නිසි බරකින් යුක්ත ය. (4) අධි බරකින් යුක්ත ය.

8. ස්ථූලතාවෙන් පෙළෙන *C* අයත්වන පරාසයේ වර්ණය,
   (1) ලා දම් පාට ය. (2) කොළ පාට ය. (3) තැඹිලි පාට ය. (4) තද දම් පාට ය.

9. පිරිවෙනෙහි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් තම ජීවිතයට යහපතක් උදා කර දීමට කටයුතු කරන සියලු දෙනා සමග හොඳින් ඇසුරු කරයි. එම තොරතුරු අනුව එම භික්ෂූන් වහන්සේ,
   (1) යහපත් අන්තර් පුද්ගල සබඳතා ඇති කෙනෙකි.
   (2) කරුණාවන්ත කෙනෙකි.
   (3) සිල්වත් කෙනෙකි.
   (4) සැදැහැවත් කෙනෙකි.

● ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමකගේ ගුණාංග කිහිපයක් පහත දැක්වේ. ප්‍රශ්න අංක **10** සහ **11** ට පිළිතුරු සැපයීම සඳහා මෙම තොරතුරු උපයෝගී කර ගන්න.

*A* – ශරීරය ශීඝ්‍රයෙන් වර්ධනය වේ.
*B* – ස්වාධීනව කටයුතු කිරීමට කැමති ය. නිර්මාණශීලී ය.
*C* – සමාජශීලී ය.

10. එම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ පසුවන්නේ,
   (1) තරුණ වියෙහි ය. (2) ළමා වියෙහි ය.
   (3) නව යොවුන් වියෙහි ය. (4) මැදි වියෙහි ය.

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka ,

11. එම භික්ෂූන් වහන්සේ තුළ දැකිය හැකි මානසික වෙනස්කම් දක්වා ඇති වැකිය/වැකි වන්නේ,
   (1) *A* පමණි. (2) *B* පමණි.
   (3) *C* පමණි. (4) *A*, *B* හා *C* යන සියල්ල ම ය.

● පිරිවෙනෙහි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පැවති වෛද්‍ය පරීක්ෂණයක දී *P*, *Q*, *R*, *S* යන භික්ෂූන් වහන්සේලා සිව්දෙනාගේ පෝෂණ ඌනතා පිළිබඳව අනාවරණය වූ කරුණු කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරින් අංක **12** සිට **14** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ | ඌන පෝෂකය |
|---|---|
| *P* | යකඩ |
| *Q* | විටමින් *A* |
| *R* | කැල්සියම් |
| *S* | අයඩින් |

12. මෙම භික්ෂූන් වහන්සේලාගෙන් ඇස් පෙනීමේ දුර්වලතා පෙන්වනු ඇත්තේ,
   (1) *P* භික්ෂූන් වහන්සේ ය. (2) *Q* භික්ෂූන් වහන්සේ ය.
   (3) *R* භික්ෂූන් වහන්සේ ය. (4) *S* භික්ෂූන් වහන්සේ ය.

13. ගලගණ්ඩය/වායු ගෙඩි (Goitre) ඇතැයි අනුමාන කළ හැක්කේ,
   (1) *P* භික්ෂූන් වහන්සේට ය. (2) *Q* භික්ෂූන් වහන්සේට ය.
   (3) *R* භික්ෂූන් වහන්සේට ය. (4) *S* භික්ෂූන් වහන්සේට ය.

14. නිරක්තයට ලක්විය හැක්කේ,
   (1) *P* භික්ෂූන් වහන්සේ ය. (2) *Q* භික්ෂූන් වහන්සේ ය.
   (3) *R* භික්ෂූන් වහන්සේ ය. (4) *S* භික්ෂූන් වහන්සේ ය.

15. විවිධ පෝෂ්‍ය පදාර්ථ එක්වර ලබාගත නොහැකි ආහාර වර්ගය මින් කවරක් ද?
   (1) කලවම් පලා මැල්ලුම (2) සුප් වර්ග
   (3) හත් මාළුව (4) තම්බන ලද බතල

16. දූෂිත වූ ආහාර හෝ ජලය පරිභෝජනය කිරීම නිසා බැක්ටීරියාවක් මගින් පැතිරෙන මෙම රෝගයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ දියර තත්ත්වයෙන් මල පිටවීම ය. මෙම රෝග තත්ත්වය,
   (1) පාචනය (Diarrhoea) වේ. (2) ඩෙංගු වේ.
   (3) නියුමෝනියාව වේ. (4) පණු රෝගයක් වේ.

17. ඩෙංගු රෝගය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.
   *A* – ඩෙංගු රෝගය මර්දනය සඳහා පියවර ගැනීම අප සැමගේ වගකීමකි.
   *B* – ඩෙංගු රෝගය මර්දනයේ වගකීම සම්පූර්ණයෙන් ම පැවරී ඇත්තේ වෛද්‍යවරුන් හා මහජන සෞඛ්‍ය නිලධාරීන් වෙත ය.
   *C* – ඩෙංගු රෝගය මාරාන්තික විය හැකි ය.
   මෙම ප්‍රකාශ අතුරින් ඩෙංගු රෝගය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,
   (1) *A* සහ *B* ය. (2) *B* සහ *C* ය.
   (3) *A* සහ *C* ය. (4) *A*, *B* සහ *C* යන සියල්ල ම ය.

18. විදුලි සැර වැදීමකට ලක්වී ඇති රෝගියකුට ප්‍රථමාධාර ලබා දීමේ දී ඔබ ප්‍රථමයෙන් ම කළ යුත්තේ,
   (1) රෝගියා සම්බාහනය (Massage) කිරීම ය.
   (2) රෝගියාගේ බිය තුරන් කිරීම ය.
   (3) රෝගියා වහා රෝහල වෙත ගෙන යාම ය.
   (4) ප්‍රධාන ස්විච්චිය (Main switch) විසන්ධි කිරීම ය.

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka ,
Department of Examinations Sri Lanka ,

19. මිනිසාගේ සිරුරට ඇතුළු වී ඔහුගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය විනාශ කිරීමේ හැකියාවක් ඇති එක්තරා වෛරසයක් නිසා මිනිසා සීමාරහිතව ආසාදනවලට ගොදුරු වීමට ඉඩ ඇත. එම වෛරසය වන්නේ,
    (1) 'ඩෙංගු' වෛරසයයි. (2) 'ඉබෝලා' වෛරසයයි.
    (3) 'HI' වෛරසයයි. (HIV) (4) 'හර්පීස්' වෛරසයයි.

20. මිනිස් සිරුරේ මූලික තැනුම් ඒකකය වන්නේ,
    (1) සෛලයයි. (2) අවයවයයි. (3) පටකයයි. (4) පද්ධතියයි.

21. මෙම ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    (1) බිත්තර කැඩීමට පෙර සේදීම සිදු කරන්නේ බිත්තර කටුවේ සැල්මොනෙල්ලා බැක්ටීරියාව තිබිය හැකි බැවිනි.
    (2) ආසාදිතයකුගේ කෙළ, කඳුළු සහ දහදිය මගින් HIV සම්ප්‍රේෂණය විය හැකි ය.
    (3) වෘක්කවල හෝ මුත්‍රාශයේ කැල්සියම් ඔක්සලේට් ලවණ ස්ඵටික (කැට) බවට පත්වීමෙන් මුත්‍ර ගල් සෑදේ.
    (4) සම බහිස්‍රාවී ඉන්ද්‍රියයක් ලෙස ක්‍රියා කරන අතර සිරුරේ විශාල ම ඉන්ද්‍රියයි.

22. පුරුද්දක් ලෙස මත්වතුර හා දුම්පානය කරන පුද්ගලයකු හදිසියේ ම පපුවේ වේදනාවක් ඇතිවීම හේතුවෙන් රෝහල් ගත කරන ලදී. ඔහු හෘද රෝගයකින් පෙළෙන බව වෛද්‍ය මතය විය. එම පුද්ගලයාගේ රෝග තත්ත්වයට සෘජුව ම සම්බන්ධ වන පද්ධතිය වන්නේ,
    (1) ශ්වසන පද්ධතියයි. (2) ආහාර ජීරණ පද්ධතියයි.
    (3) රුධිර සංසරණ පද්ධතියයි. (4) ස්නායු පද්ධතියයි.

23. අප මුඛයෙන් ගන්නා ආහාර ගිලීමේ දී ශ්වසන මාර්ගයට පිවිසීම අවහිර කරන්නේ,
    (1) අපිජිහ්විකාව මගිනි. (2) ස්වරාලය මගිනි.
    (3) ග්‍රසනිකාව මගිනි. (4) දිව මගිනි.

- අංක **24** සහ **25** යන ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා සුදුසු වචන තෝරන්න.

24. ආමාශයේ දී ජීරණය වූ ආහාර අඩංගු තරලය ...................... නමින් හැඳින්වේ.
    (1) ආමලසය (2) ආමාශයික යූෂය (3) පිත (4) ආන්ත්‍රික යූෂය

25. ඔක්සිජන් වායුව රහිතව ජීවීන් තුළ සිදු කෙරෙන ශ්වසන ක්‍රියාවලිය ...................... නම් වේ.
    (1) ස්වායු ශ්වසනය (2) නිර්වායු ශ්වසනය
    (3) ආශ්වාසය (4) ප්‍රශ්වාසය

26. නිරෝගී පරිණත පුද්ගලයකු දිනකට බැහැර කරන මූත්‍ර ප්‍රමාණය දළ වශයෙන්,
    (1) ලීටර 1.5 – 2.0 ත් අතර වේ. (2) ලීටර 2.5 – 3.0 ත් අතර වේ.
    (3) ලීටර 3.5 – 4.0 ත් අතර වේ. (4) ලීටර 4.5 – 5.0 ත් අතර වේ.

- පහත *M*, *N* සහ *O* යන අක්ෂරවලින් දක්වා ඇති පද්ධති පිළිබඳ විස්තර උපයෝගී කර ගනිමින් අංක **27** සිට **29** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

    *M* – සංවේදන හා ප්‍රතිචාර සඳහා අදාළ පණිවිඩ හුවමාරුව සිදු කරයි.
    *N* – සෛලවල සිදුවන ජීව ක්‍රියා හේතුවෙන් නිපදවෙන ශරීරයට හානිකර අපද්‍රව්‍ය සිරුරෙන් බැහැර කරයි.
    *O* – සෛලවල ජීව ක්‍රියා සඳහා අවශ්‍ය ඔක්සිජන් වාතයෙන් ලබා ගැනීමත් සෛලවලින් පිට කරන කාබන් ඩයොක්සයිඩ් වාතයට මුදා හැරීමත් සිදු කරයි.

[ 5 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

27. ඉහත දක්වා ඇති *M, N* හා *O* පද්ධති පිළිවෙලින්,
    (1) බහිස්ස්‍රාවී පද්ධතිය, ස්නායු පද්ධතිය සහ ශ්වසන පද්ධතිය වේ.
    (2) ස්නායු පද්ධතිය, බහිස්ස්‍රාවී පද්ධතිය සහ ශ්වසන පද්ධතිය වේ.
    (3) ශ්වසන පද්ධතිය, ස්නායු පද්ධතිය සහ බහිස්ස්‍රාවී පද්ධතිය වේ.
    (4) ස්නායු පද්ධතිය, ශ්වසන පද්ධතිය සහ බහිස්ස්‍රාවී පද්ධතිය වේ.

28. අංශභාගය හා ක්ෂය රෝගය මගින් සෘජුව ම බලපෑම් ඇති කරන පද්ධති පිළිවෙළින් දැක්වෙන ඉංග්‍රීසි අක්ෂර වන්නේ,
    (1) *M* සහ *N* ය. (2) *N* සහ *O* ය. (3) *M* සහ *O* ය. (4) *O* සහ *M* ය.

29. *O* පද්ධතිය ආශ්‍රිත රෝගයක් වන්නේ පහත සඳහන් කවරක් ද?
    (1) දියවැඩියාව (2) අපස්මාරය (මීමැස්මොරය)
    (3) ත්‍රොම්බෝසිස් (4) නියුමෝනියාව

● රුධිර පාරවිලයනයේ දී රුධිර ගණ ගැළපීම පිළිබඳ පහත දක්වා ඇති සටහන උපයෝගී කොටගෙන ප්‍රශ්න අංක **30** සහ **31** ට පිළිතුරු සපයන්න.




30. සර්ව දායකයා ලෙස හැඳින්විය හැකි පුද්ගලයාගේ රුධිරය අයත් වන රුධිර ගණය,
    (1) *O* ය. (2) *A* ය. (3) *B* ය. (4) *AB* ය.

31. සර්ව ප්‍රතිග්‍රාහකයා වන්නේ කුමන ගණයේ රුධිරය ඇති පුද්ගලයා ද?
    (1) *O* (2) *AB* (3) *A* (4) *B*

32. ස්වාමීන් වහන්සේ නමකගේ ධර්ම දේශනයකට මම සහභාගි වුයෙමි. මේ අවස්ථාවේ දී සංවේදී ඉන්ද්‍රියයක් ලෙස ක්‍රියා කළ කනෙහි සංවේදනය වූයේ,
    (1) ස්වාමීන් වහන්සේගේ මුවින් නිකුත් වූ හඬ ය.
    (2) ධර්ම දේශනය ඇසීම ය.
    (3) ධර්ම දේශනය අගය කිරීම ය.
    (4) ධර්ම දේශනය පිළිබඳව සාකච්ඡා කිරීම ය.

33. ප්‍රතිශක්තිකරණය සඳහා උපන් විගස ම නවජයාට ලබා දෙන්නේ,
    (1) *BCG* එන්නත ය. (2) *MMR* එන්නත ය. (3) *JE* එන්නත ය. (4) ත්‍රිත්ව එන්නත ය.

34. දේශීය වෛද්‍ය ක්‍රමයේ මුල් තැන දෙනු ලබන්නේ,
    (1) රෝග පිළිබඳව දැනුවත් වීමට ය. (2) රෝග හඳුනා ගැනීමට ය.
    (3) රෝග ප්‍රතිකාරයට ය. (4) රෝග නිවාරණයට ය.

35. රෝගියකු සඳහා අංග සම්පූර්ණ ආහාරයක් ලබා ගත යුතු බවට ආයුර්වේද වෛද්‍යවරයා විසින් උපදෙස් දෙන ලදී. ඒ අනුව ඔහු ගත යුත්තේ,
    (1) පස්ගෝරස අඩංගු ආහාරයකි. (2) ෂඩ් රසයෙන් යුත් ආහාරයකි.
    (3) තැවුම් බවින් යුත් ආහාරයකි. (4) සරල ආහාරයකි.



Department of Examinations Sri Lanka

36. ආයුර්වේදයට අනුව නිරෝගී බව උදෙසා ආහාර පරිභෝජනයේ දී 'යෝග්‍ය කාලය' යනුවෙන් දැක්වෙන්නේ,
   (1) කුසගින්න දැනෙන අවස්ථාවේ දී ආහාර ගැනීම ය.
   (2) කුසගින්න දැනී පැය ½ කට පසු ආහාර ගැනීම ය.
   (3) කුසගින්න දැනී පැයකට පසු ආහාර ගැනීම ය.
   (4) කුසගින්න දැනීමට ප්‍රථම ආහාර ගැනීම ය.

37. අභිචාරාත්මක ප්‍රතිකාර විධි වර්ගයක් නොවන්නේ,
   (1) පිරිත් කීම ය. (2) බලිතොවිල් ය. (3) ශාන්තිකර්ම ය. (4) භාවනාව ය.

38. සුෂුම්නාව අනතුරකට භාජනය වූයේ යැයි සැක කරන රෝගියකු වහා රෝහල වෙත ගෙන යා යුත්තේ,
   (1) පුටුවක හිඳුවා ගෙන ය.
   (2) වැතිර සිටින ඉරියව්වෙන්, තිදෙනෙකු විසින් ඔසවා ගෙන ය.
   (3) ආරක්ෂිතව ලෑල්ලක් මත තබා ගෙන ය.
   (4) පුද්ගලයකුගේ කර මත තබා ගෙන ය.

● පහත සඳහන් *A, B, C* සහ *D* යන සිද්ධි යුගල අධ්‍යයනය කර ප්‍රශ්න අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

*A* – (i) මත්ද්‍රව්‍ය, මත්වතුර භාවිත කර රිය පැදවීමෙන් වැළකී සිටීම
   (ii) මහාමාර්ගයේ අනතුරු ඇති වීම
*B* – (i) ලුනු, සීනි සහ මේද අධික ආහාර පරිභෝජනය අවම කිරීම
   (ii) බෝ නොවන රෝග වැළඳීමේ අවදානම ඇති වීම
*C* – (i) තයිරොක්සින් නිපදවීම සඳහා ප්‍රමාණවත් පරිදි අයඩීන් නොලැබීම
   (ii) තයිරොයිඩ් ග්‍රන්ථියේ විශාල වීම (ඉදිමීම)
*D* – (i) හිමොෆිලියා රෝග තත්ත්වය ඇති වීම
   (ii) නාසයෙන් ලේ ගැලීම

39. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල වන්නේ,
   (1) *A* සහ *B* ය. (2) *A* සහ *C* ය. (3) *B* සහ *D* ය. (4) *C* සහ *D* ය.

40. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල වන්නේ,
   (1) *A* සහ *B* ය. (2) *A* සහ *D* ය. (3) *B* සහ *C* ය. (4) *C* සහ *D* ය.

*(ලකුණු 01 × 40 = 40 යි)*

* *



Department of Examinations Sri Lanka ,
Department of Examinations Sri Lanka ,

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

2625

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW

**2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්** 09 S I, II

**(නව නිර්දේශය)**

**(09) සෞඛ්‍ය විද්‍යාව - I, II**

**සෞඛ්‍ය විද්‍යාව - II පත්‍රය**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය.
* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1. සෞඛ්‍ය ප්‍රවර්ධන පිරිවෙනක් ලෙස සම්මානයට පාත්‍ර වූ සිරි සරණ පිරිවෙනෙහි සෞඛ්‍ය සංගමය සංවිධානය කළ සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා අවට පිරිවෙන්වල භික්ෂූන් වහන්සේ මෙන් ම දායක දායිකාවෝ ද සහභාගි වූහ.

පිරිවෙනට ඇතුළුවන විට ම එහි පරිසරය කසලවලින් තොරව පිරිසිදු ලෙස පවත්වාගෙන යන වටපිටාවක් බව දැකිය හැකි වුවද තැන් තැන්වල ඉවත දැමූ මැටි පහන්, පොලිතින් බෑග් වැනි අපද්‍රව්‍ය දැකිය හැකි විය. තව ද පූජා සඳහා යොදන ජලය කාණු අයිනේ තැන්පත් වී රැඳී පවතිනු දැකිය හැකි ය.

වැඩසටහනෙහි පළමු දේශනය සිදු කළ බටහිර වෛද්‍යතුමා විසින් වර්තමාන සමාජයේ බහුල පිළිකා, හෘද රෝග වැනි බෝ නොවන රෝග මෙන් ම ඒවායින් වැළකීම සඳහා පෝෂ්‍යදායි ආහාර පරිභෝජනය ඇතුළු අනුගමනය කළ යුතු යහපුරුදු හා දිනපතා ප්‍රමාණවත් ව්‍යායාම්වල යෙදීමේ වැදගත්කම පැහැදිලි කරන ලදී.

අනතුරුව දේශනය සිදු කළ පෝෂණවේදියා ආහාර නිෂ්පාදයේ දී, ප්‍රවාහනයේ දී ඇතුළු ආහාර සුරක්ෂිතතාව කෙරෙහි අවධානය යොමු විය යුතු අවස්ථා මෙන් ම නරක් වූ ආහාර හඳුනාගත හැකි ලක්ෂණ ලෙස දුගඳ හැමීම, වර්ණය වෙනස්වීම ඇතුළු කරුණු කිහිපයක් ද එවැනි ආහාර භාවිතයේ ප්‍රතිඵල ද ගෙන හැර දැක්වී ය.

සෞඛ්‍ය විද්‍යාව හා සැසඳෙන බුදු දහමෙහි විනය ශික්ෂා පද පිළිබඳ ව පරිවෙනාධිපති ස්වාමීන් වහන්සේ විසින් පැහැදිලි කළ අතර එහි දී බුදුරජාණන් වහන්සේ දේශනා කළ ගිතෙල්, තලතෙල්, උක්හකුරු ඇතුළු පස් බෙහෙත් භාවිතයේ ආනිසංස හා ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශ පිළිබඳව ද දේශනා කරන ලදී.

දහවල් දානය සඳහා දායකයින් විසින් බත්, තෙල් දැමූ පරිප්පු, බෝංචි, පලා මැල්ලුමක් හා පලතුරු සූදානම් කර තිබුණි. දහවල් දානයෙන් පසුව භික්ෂූන් වහන්සේ මද වේලාවක් සක්මනෙහි නිරත වූ අතර සවස් කාලයේ දී ආයුර්වේද වෛද්‍යතුමා ආයුර්වේදයට අනුව ප්‍රධාන ප්‍රතිකාර ක්‍රම වන වමන, විරේචන, වස්ති ආදී පංච ප්‍රතිකර්ම පැහැදිලි කර දුන්නේ ය.

අවසානයේ දී භාවනාමය වැඩසටහනක් ක්‍රියාත්මක වූ අතර අනතුරුව සියලු දෙනා සැහැල්ලු මනසකින් යුතුව පිරිවෙන් භූමියෙන් සතුටින් විසිරී ගියහ.

(i) පිරිවෙන් පරිසරයේ දැකිය හැකි සෞඛ්‍යයට තර්ජනයක් විය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(ii) බෝනොවන රෝගවලින් වැළකීම සඳහා සිද්ධියේ දක්වා ඇති යහපුරුදු හැර වෙනත් යහපුරුදු දෙකක් ලියන්න.

(iii) බටහිර වෛද්‍යතුමා සඳහන් කළ රෝගවලට අමතරව සමාජයේ බහුලව පවතින වෙනත් බෝනොවන රෝග දෙකක් නම් කරන්න.

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(iv) පෝෂණවේදියා පැවසූ පරිදි ආහාරවල සුරක්ෂිතතාව රැක ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු අනෙක් අවස්ථා දෙක සඳහන් කරන්න.

(v) සිද්ධියේ සඳහන් ලක්ෂණ හැර නරක් වූ ආහාර හඳුනාගත හැකි වෙනත් ලක්ෂණ දෙකක් ලියන්න.

(vi) පිරිවෙනාධිපති ස්වාමීන් වහන්සේ දේශනා කළ පරිදි තථාගතයන් වහන්සේ විසින් දේශනා කරනු ලැබූ පස් බෙහෙත් අතර සිද්ධියේ සඳහන් නොවන බෙහෙත් වර්ග දෙක සඳහන් කරන්න.

(vii) පිරිවෙනාධිපති ස්වාමීන් වහන්සේට අනුව 'ත්‍රිකෝටික පාරිශුද්ධ මාංස' යන්න පැහැදිලි කරන්න.

(viii) දායකයන් විසින් භික්ෂූන් වහන්සේලා වෙත පිළිගන්වන ලද ආහාර වේලෙහි අඩංගු වූ පෝෂකාංග නම් කරන්න.

(ix) දහවල් දානයෙන් පසු භික්ෂූන් වහන්සේලා සක්මනෙහි යෙදීම හේතුවෙන් උන් වහන්සේලාට ලැබුණු ආනිසංස හතරක් ලියන්න.

(x) ආයුර්වේද වෛද්‍යතුමා සඳහන් කළ පංචකර්ම ප්‍රතිකාරවල ඇතුළත් 'වමන' හා 'විරේචන' පැහැදිලි කරන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

2. (i) වර්තමානයේ සෞඛ්‍ය තත්ත්වය රැක ගැනීමට ඇති අභියෝග දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) සෞඛ්‍යවත් පිරිවෙන් සංකල්පය යටතේ බෞද්ධ භික්ෂුවක් ලෙස පිරිවෙන් පරිසරය සිත් ගන්නා අයුරින් සකස් කළ හැකි ආකාරය ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) සෞඛ්‍ය ප්‍රවර්ධනය උදෙසා ප්‍රජා සහභාගිත්වය ලබාගෙන පිරිවෙන තුළ ක්‍රියාත්මක කළ හැකි වැඩසටහනක් නම් කර, එය ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

3. (i) ආහාර ජීරණ පද්ධතියේ මුඛයේ සිට ගුදය දක්වා ආහාර ගමන් ගන්නා මාර්ගය ගැලීම් සටහනක් මගින් ඉදිරිපත් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ආහාර ජීරණයේ දී මුඛයේ දායකත්වය සංක්ෂිප්තව දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) ආහාර ජීරණ පද්ධතියේ යහපැවැත්ම සඳහා අනුගමනය කළ යුතු යහපුරුදු පහක් සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

4. (i) ශිෂ්‍යයෙකු ලෙස විවේකය යහපත් හා ඵලදායී ලෙස යොදා ගැනීමට සුදුසු කාර්ය දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) බෞද්ධ භික්ෂුවක් පෞද්ගලික ස්වස්ථතාව රැක ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තුනක් සැකෙවින් දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) "සුවදායී පරිසරයක් උදෙසා රුක් රෝපණය වැදගත් වේ." බුදු දහමෙන් උදාහරණ ගෙනහැර පාමින් මෙම කියමන සනාථ කරන්න. *(ලකුණු 05 යි)*

5. (i) පමණ දැනගෙන ආහාර අනුභව කිරීමෙන් අත්වන යහපත් ප්‍රතිඵල හතරක් ලියන්න. *(ලකුණු 02 යි)*

(ii) "බුදු දහම රැක ගනිමින් ඉදිරියට පවත්වාගෙන යාමට මහා සඟරුවන නිරෝගීව තබා ගැනීම සඳහා සුදුසු ආහාර වට්ටෝරු පොදු ජනයා අතර ප්‍රචලිත කළ යුතු වේ." මේ අනුව භික්ෂූන් වහන්සේලාට දානය සකස් කරන ආකාරය පිළිබඳව දායක ජනතාවට දිය යුතු උපදෙස් තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි භික්ෂූන් වහන්සේලා දත් වැළඳීමේ දී අනුගමනය කළ යුතු යහපුරුදු පහක් දක්වන්න. *(ලකුණු 05 යි)*

6. (i) මානසික සුවයෙන් යුතු භික්ෂූන් වහන්සේ කෙනෙකු තුළ දක්නට ලැබෙන ලක්ෂණ හතරක් ලියන්න. *(ලකුණු 02 යි)*

(ii) රෝග සුවපත් කිරීම හැර, භාවනාවෙන් ඔබේ දිවියට ළඟා කරගත හැකි ප්‍රතිලාභ තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) මනෝ චිකිත්සක ප්‍රතිකාර ක්‍රමයක් ලෙස භාවනාවෙන් රෝග සුව කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

[ 9 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

7. (i) තථාගතයන් වහන්සේ විකාල භෝජන ශික්ෂාපාදය පැනවීමට පාදක වූ කරුණු සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) විකාල භෝජනයෙන් වෙන් වීම තුළින් ලැබෙන පංචවිධ ආනිසංස දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) බුදු දහමේ අන්තර්ගත සෞඛ්‍ය විද්‍යාත්මක කරුණු හුවා දැක්වීම සඳහා ධම්ම පදයෙහි සඳහන් 'ආරෝග්‍ය පරමා ලාභා ..........' යන ගාථාව සහ ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් 'සෞඛ්‍යය' සඳහා දී ඇති නිර්වචනය සසඳන්න. *(ලකුණු 05 යි)*

8. (i) ආයුර්වේදයේ ඉගැන්වීමට අනුව රෝගවලට හේතු වන ප්‍රධාන දෝෂ තුන (තුන්දොස්) ලියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) දේශීය වෛද්‍ය ක්‍රමයට 'ආයුර්වේදය' යන නාමය ලැබීමට හේතු වූ කරුණු තුනක් ඉදිරිපත් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) ආයුර්වේදයට අනුව නිරෝගී බව උදෙසා ආහාර පරිභෝජනයේ දී ආහාරයේ 'හිත බව' යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka ,
Department of Examinations Sri Lanka ,